ඉතාලිය

MINISTERO DELL'INTERNO

euaa EUROPEAN UNION AGENCY FOR ASYLUM

# පිළිගැනීම තුළ ඔබේ අයිතීන් සහ වගකීම්



**මෙම තොරතුරු ඔබ සඳහායි:**

- ඔබට වයස අවුරුදු 18 ට අඩු  නම්
- ඔබ පැමිණියේ ඔබේ දෙමව්පියන්ගෙන් එක් අයෙකු හෝ දෙදෙනාම සමඟ නම්
- ඉතාලිය හි රැකවරණය (ජාත්‍යන්තර ආරක්ෂාව ලෙසද හැඳින්වේ) සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය බව ඔබ බලධාරීන්ට පැවසුවේ නම්

**ඔබ මෙම රට තුළ ආරක්ෂිතයි.**

SINHALESE

යුරෝපයේ, වයස අවුරුදු 18 ට අඩු සෑම කෙනෙකු ම දරුවෙකු ලෙස සැලකෙන අතර **විශේෂ සහාය** ලබා ගැනීමේ අයිතිය ඇත.

## ඔබට උපකාර කරන්නේ කවුද?



ඔබ මෙහි සිටින්නේ ඔබේ දෙමාපියන් නොමැතිව නිසා, **භාරකරුවෙකු**ලෙස හඳුන්වන තවත් වැඩිහිටියෙකු ඔබේ අවශ්‍යතා සඳහා ඔබට උපකාර කරනු ඇත. මෙම පුද්ගලයා බලධාරීන්ගෙන් ස්වාධීනය.

ඔබට තවමත් ඔබේ භාරකරුහමු වී නොමැති නම්, හැකි ඉක්මනින් ඔබට ඔවුන්ව හමුවනු ඇත.

එතෙක්, බලධාරීන් ඔබට සහාය වීමට සහ ඔබව නියෝජනය කිරීමට තවත් වැඩිහිටියෙකු පත් කරනු ඇත.

## භාරකරුගේ කාර්යභාරය කුමක්ද?

ඔබේ භාරකරු ඔබේ නැවතී සිටීම පිළිබඳව ඔබ දැනගත යුතු සියල්ල ඔබට පැහැදිළි කර දී ඔබේ ගැටලුවලට පිළිතුරු සොයා ගැනීමට ඔබට උපකාර කරයි. අනෙකුත් කාර්ය මණ්ඩලය ද මෙම ගැටලු සඳහා ඔබට උපකාර කරනු ඇත.

ඔබේ භාරකරු ඔබට අවශ්‍ය මොනවාද යන්න බලධාරීන්ට පවසයි, ඔබට උපදෙස් ලබා දෙයි සහ වැදගත් තීරණ ගැනීමට ඔබට සහාය වෙයි.

ඔබට සැමවිටම ඔබේ අවශ්‍යතා සහ හැඟීම් ප්‍රකාශ කළ හැකි අතර ඔබේ භාරකරුට/නියෝජිතයාට ඔබේ අදහස පැවසිය හැකිය.

ඔබේ භාරකරු සමඟ ඔබට ගැටලුවක් ඇත්නම්, කාර්ය මණ්ඩලයට පවසන්න.

ඔබට සැමවිටම කාර්ය මණ්ඩලයෙන් උපකාර සහ සහාය ඉල්ලා සිටිය හැකිය. බිය නොවන්න, ගැටළු එකට එක්ව විසඳා ගත හැකිය!

ඔබට වැටහෙන භාෂාවකින් සන්නිවේදනය කිරීමට **පරිවර්තකයෙකුට** උපකාර කළ හැකිය. ඔවුන්ගේ කාර්යභාරය වන්නේ ඔබ සහ අනෙක් අය පවසන දේ ඒ ආකාරයෙන්ම පරිවර්තනය කිරීමයි.

## ඔබේ පවුලේ අය සමඟ සම්බන්ධ වීමට අවශ්‍ය නම් ඔබට කළ හැක්කේ කුමක්ද?

ඔබේ පවුලේ අය කොහේදැයි ඔබ නොදන්නේ නම්, හෝ ඔවුන් සමඟ සම්බන්ධතා නැති වී ඇත්නම්, කාර්ය මණ්ඩලය ඔබේ පවුල සෙවීමට ඔබට උපකාර කරනු ඇත.

යුරෝපයේ ඔබේ පවුලේ අය සිටී නම්, ඔබේ පවුල පිළිබඳව ඔබ දන්නා සියල්ල කාර්ය මණ්ඩලයට පවසන්න.



## ප්‍රවේශම් වන්න, ඇතැම් අය ඔබව අනතුරේ හෙළීමට ඉඩ ඇත



ඔබට මේ රට හැර යාමට සිතෙන්නට හැකිය, නැතහොත් ඇතැම් අය ඔබව පලා යාමට ඒත්තු ගැන්වීමට උත්සාහ කරනු ඇත. එය ඔබට අනතුරුදායක විය හැකි අතර ඔබේ රැකවරණ අයදුම්පතට ඍණාත්මක ප්‍රතිවිපාක ඇති කළ හැකිය.

ඔබේ භාරකරුසහ කාර්ය මණ්ඩලය සමඟ කතා කරන්න, ඔබට ඔවුන්ට තත්වය පැහැදිලි කළ හැකි අතර ඔවුන්ට ඔබට උපදෙස් ලබා දිය හැකිය.

# ඔබට ලැබෙන්නේ මොනවාද?

බලධාරීන් ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කරන තෙක් ඔබ රැඳී සිටින අතරතුර ඔබට විවිධ ආකාරයේ සහාය සහ සේවාවන් ලැබෙනු ඇත. මෙය **පිළිගැනීම** ලෙස හැඳින්වේ.



මෙම විස්තර පත්‍රිකාවේ ඇති තොරතුරු ඔබට ලැබුණු බව තහවුරු කරන ලෙස කාර්ය මණ්ඩලය ඔබෙන් අසනු ඇත. මෙම විස්තර පත්‍රිකාවේ කොටස් ඔබට වැටහෙන්නේ නැත්නම් හෝ ඔබට කිසියම් ප්‍රශ්නයක් ඇත්නම්, භාරකරුගෙන් සහ කාර්ය මණ්ඩලයෙන් අසා දැනගන්න.

ඉදිරි දිනවල දී ඔබට අමතර තොරතුරු ලැබෙනු ඇත.

**ඔබට මේවා ලැබෙනු ඇත:**



- නිදා ගැනීමට ස්ථානයක්



- පුද්ගලික සනීපාරක්ෂක නිෂ්පාදන



- ආහාර



- දෛනික වියදම් සඳහා මුදල්



- ඇඳුම් පැළඳුම්



දරුවෙකු ලෙස, ඔබට අධ්‍යාපනය ලැබීමට සහ ඉගෙනීමට අයිතිය තිබේ. ඔබට ඉගෙනීමට, සංවර්ධනය වීමට සහ නව මිතුරන් ඇති කර ගැනීමට උපකාර කිරීම සඳහා අධ්‍යාපනික සහ විනෝදාත්මක ක්‍රියාකාරකම් පිළිබඳව කාර්ය මණ්ඩලය ඔබට පවසනු ඇත.





ඔබේ වයස සහ ඔබේ තත්ත්වය අනුව, ඔබට අවශ්‍ය නම්, රැකියාවක නිරත වීමට ඔබට අවසර ලැබිය හැකිය. ඔබේ භාරකරු සහ කාර්ය මණ්ඩලය ඔබට වැඩිදුර තොරතුරු ලබා දෙනු ඇත.

## සෞඛ්‍ය සේවා සඳහා අයිතිය

**ඔබට අවශ්‍ය සෞඛ්‍ය සේවාව ඔබට ලැබෙන බවට බලධාරීන් සහතික වනු ඇත.**

හෙදියක හෝ වෛද්‍යවරයෙකු සමඟ වෛද්‍ය පරීක්ෂණයකට සහභාගී වීමට ඔබට සිදු විය හැකි වනු ඇති බව කාර්ය මණ්ඩලය ඔබට දැනුම් දෙනු ඇත.





## කාර්ය මණ්ඩලයට හෝ ඔබේ භාරකරුට දන්වන්න:

- ඔබට අසනීප වී, තුවාල ලබා හෝ හදිසි වෛද්‍ය ආධාර අවශ්‍ය නම්
- ඔබට ආබාධයක් තිබේ නම්
- ඔබව අපයෝජනයට ලක් කර ඇත්නම්
- ඔබට යම් කෙනෙකු පිළිබඳ ව බියක් දැනුණේ හෝ දැනෙන්නේ නම්
- ඔබ ගැබ්ගෙන සිටී නම් ගැබ්ගෙන සිටිය හැකි නම්
- ඔබට ඕනෑම හේතුවක් නිසා සහාය අවශ්‍ය නම්

ඔබට බොහෝ විට දුකක්, කෝපයක්, බියක්, කනස්සල්ලක් දැනේ නම් හෝ ඔබට නිදා ගැනීමට අපහසු බවක් දැනේ නම්, ඔබට **මනෝ විද්‍යාඥයෙකු** සමඟ කතා කළ හැකිය.

ඔබට හෙදිය, වෛද්‍යවරයා, මනෝ විද්‍යාඥයා, කාර්ය මණ්ඩලය සහ භාරකරු/නියෝජිතයා පිළිබඳව විශ්වාස තැබිය හැකිය. ඔබ පවසන කිසිවක් ඔබේ එකඟතාවයකින් තොරව ඔබේ භාරකරු/නියෝජිතයා හැර වෙනත් කිසිවෙකු සමඟ බෙදා නොගනු ඇත. එය එසේ නොවන්නේ ඔබේ හෝ වෙනත් කෙනෙකුගේ ජීවිතය අවදානමට ලක්ව ඇත්නම් පමණි.

## ඔබ නැවතී සිටින්නේ කොහේද?



බලධාරීන් ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කරන අතරතුර ඔබ නැවතී සිටින ස්ථානය රඳා පවතින්නේ ඔබේ වයස සහ අවශ්‍යතා මතයි.

ඔබ නැවතී සිටිය යුතු ස්ථානය භාරකරු සහ කාර්ය මණ්ඩලය ඔබට දැනුම් දෙනු ඇත. **බලධාරීන් විසින් තීරණය කරන ලද ස්ථානයේ පමණක් ඔබට සහාය සහ සේවා ලැබෙනු ඇත.**

**ඉතා කලාතුරකින්, ළමුන්ට අවශ්‍ය පරිදි පැමිණ යා නොහැකි මධ්‍යස්ථානයකට ඔවුන්ව යොමු කළ හැකිය. ඔබ මෙම තත්වයේ සිටී නම්, ඔබේ භාරකරු, නීති උපදේශකයෙකු සහ කාර්ය මණ්ඩලය ඔබට සහාය වනු ඇත.**

නීති උපදේශකයෙකු යනු මේ රටේ නීතීන් දන්නා, ඔබේ තත්වය අධ්‍යයනය කළ හැකි සහ ඔබට සහාය විය හැකි පුද්ගලයෙකි.



**ඔබේ කොතැනක නැවතී සිටියත් ඔබට සුරක්ෂිතව සිටීමට අයිතිය ඇත. කිසිවෙකුට පහත දේ සඳහා ඉඩ නැත:**




ඔබට තර්ජනය කිරීමට

ඔබට අපහාස කිරීමට

ඔබට හානි සිදු කිරීමට

ඔවුන් කවුරුන් වුවත්, ආගන්තුකයෙකු හෝ ඔබ දන්නා කෙනෙකු වුවත්.
කාර්ය මණ්ඩලය හෝ ඔබේ භාරකරු සමඟ ඔබට කිසියම් ගැටළුවක් ඇත්නම්, ඔබට ඒ පිළිබඳව කතා කළ හැකිය.

## පිළිගැනීම තුළ ඔබේ වගකීම් මොනවාද?

ඔබේ කතාව පැවසීමට ඇතැම් විට බියක් හා දුෂ්කර බවක් දැනුණ ද, ඔබ සත්‍යය පැවසීම සහ බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම වැදගත් වේ.

ඔබේ භාරකරුට/නියෝජිතයාට සහ කාර්ය මණ්ඩලය ඔබේ තත්ත්වය පිළිබඳව දන්නේ නම් ඔවුන්ට ඔබට උපකාර කළ හැකිය.



ඔබ ඉටු කළ යුතු වගකීම් කිහිපයක් පහතින් දැක්වේ.

- ✅ ඔබ නැවතී සිටින ස්ථානයේ නීති රීති අනුගමනය කරන්න.
- ❌ බලධාරීන් ඔබට නැවතී සිටීමට පැවසූ ස්ථානයෙන් පලා නොයන්න.
- ✅ කාර්ය මණ්ඩලය සහ ඔබේ භාරකරු/නියෝජිතයා ඔබට පැහැදිළි කරන මේ රටේ නීති අනුගමනය කරන්න.

## ඔබ ඔබේ වගකීම්වලට අනුකූල නොවන්නේ නම් කුමක් සිදුවේද?

බලධාරීන් ඔබේ තත්ත්වය ඇගයීමට ලක් කර යම් ක්‍රියාමාර්ග ගැනීමට තීරණය කළහොත් ඔබට සහ ඔබේ භාරකරුට/නියෝජිතයාට දැනුම් දෙනු ඇත.

මෙය සිදුවුවහොත්, ඔබට ඔබේ භාරකරු/නියෝජිතයා හෝ කාර්ය මණ්ඩලය සමඟ විවෘතව කතා කර ඔබේ තත්ත්වය පැහැදිළි කළ හැකිය.

බලධාරීන්ට මෙසේ තීරණය කළ හැකිය:

- ඔබ බලධාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු නොකරන්නේ නම්, **ඔබට අඩු සහයෝගයක් ලැබිය හැකිය.**
- ඔබ ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙන්නේ නම්, **ඔබට ලැබෙන සහයෝගයෙන් කොටසක් ඔබට අහිමි විය හැකිය**.



ඔබට තවමත් ලැබෙන සහායේ ආකාරය ඔබේ පුද්ගලික තත්ත්වය සහ අවශ්‍යතා මත රඳා පවතිනු ඇත.

**ඔබ දැන් ඉතාලියහි සිටින අතර, එය EU රටකි. EU+ රටවල් වන්නේ :**

යුරෝපීය සංගමයේ (EU) සාමාජික රටවල් 27: ඔස්ට්‍රියාව, බෙල්ජියම, බල්ගේරියාව, ක්‍රොඒෂියාව, සයිප්‍රසය, චෙකියාව, ඩෙන්මාර්කය, එස්තෝනියාව, ෆින්ලන්තය, ප්‍රංශය, ජර්මනිය, ග්‍රීසිය, හංගේරියාව, ඉතාලිය, ලැට්වියාව, ලිතුවේනියාව, ලක්සම්බර්ග්, මෝල්ටාව, නෙදර්ලන්තය, පෝලන්තය, පෘතුගාලය, අයර්ලන්ත ජනරජය, රුමේනියාව, ස්ලෝවැකියාව, ස්ලෝවේනියාව, ස්පාඤ්ඤය, ස්වීඩනය සහ

අනෙකුත් රටවල් 4: අයිස්ලන්තය, ලීච්ටන්ස්ටයින්, නෝර්වේ සහ ස්විට්සර්ලන්තය.


## රැකවරණය සඳහා අයදුම් කිරීම සහ EU+රටවලට ගමන් කිරීම සඳහා වන නීති



- ✔ ඔබ ඉතාලිය තුළ නැවතී සිටිය යුතු අතර අනෙකුත් එක් EU+ රටවලට හෝ පලා නොයා යුතුය.
- ✔ මෙම රටවලින් එකක ඔබේ පවුලේ සාමාජිකයන් සිටී නම්, පවුල් නැවත එක්වීම සඳහා වන ඔබේ අයිතීන් පිළිබඳව බලධාරීන් ඔබට දැනුම් දෙනු ඇත. හේතුවක් නොමැතිව පලා නොයන්න.
- ✖ ඔබ පලා ගියහොත්, සෘණාත්මක ප්‍රතිවිපාක ඇති වේ, ඒ පිළිබඳ ව පසුව පැහැදිළි කෙරෙනු ඇත. උදාහරණයක් ලෙස, ඔබට අනෙක් රට තුළ දී අඩු සහායක් පිළිගැනීමේ දී ලැබෙනු ඇත.
- ✔ බලධාරීන් ඔබට වෙනත් ආකාරයකින් දැනුම් දුන්නේ නම් මිස, ඔබ මුලින් ම පැමිණි EU+ රටෙහි ඔබේ රැකවරණ අයදුම්පත ලියාපදිංචි කළ යුතු බව මතක තබා ගන්න.
- ✔ ඔබේ රැකවරණ අයදුම්පත පරීක්ෂා කිරීම සඳහා වගකිව යුත්තේ මෙම රටවලින් එකක් පමණි. ඉතාලිය හි බලධාරීන් මේ සඳහා වගකිව යුතු රට කුමක්ද යන්න ඔබට පවසනු ඇත.

මෙම ක්‍රියාපටිපාටි පිළිබඳව ඔබ වෙනම විස්තර පත්‍රිකාවලින් වැඩිදුර දැනගනු ඇත.

## ඔබ EU+ රටවලින් එකකට පලා ගියහොත් කුමක් සිදුවේද?




**ඉතාලියෙහි:**

- ඔබේ රැකවරණ ක්‍රියාපටිපාටිය නතර විය හැකිය.

**අනෙක් EU+ රටෙහි:**

- ඔබ හැර ගිය EU+ රටට ඔබව ආපසු යැවීමට බලධාරීන් තීරණය කළ හැකිය.

බලධාරීන් ඔබව ආපසු යැවීමේ තීරණය පිළිබඳ ව ඔබට දැනුම් දුන් මොහොතේ සිට, ඔබට ඇතැම් අයිතීන් සඳහා ප්‍රවේශය නොලැබෙනු ඇත, උදාහරණයක් ලෙස:

- ඔබට ඇතැම් ආකාරයේ සහායන් නොලැබෙනු ඇති අතර
- ඔබට රැකියාවක නිරත වීමට අවසර නොලැබෙනු ඇත.

ඔබට තවමත් ලැබෙන සහායේ ආකාරය ඔබේ පුද්ගලික තත්ත්වය සහ අවශ්‍යතා මත රඳා පවතිනු ඇත.

## බලධාරීන් විසින් ගනු ලබන තීරණයකට ඔබ එකඟ නොවන්නේ නම්, ඔබට උපකාර කළ හැක්කේ කාටද?

ඔබට ඔබේ භාරකරු සමඟ කතා කර ඕනෑම ප්‍රශ්නයක් ඇසිය හැකිය.

ඔබේ භාරකරු සමඟ එක්ව ඔබට නීති උපදේශකයෙකුගෙන් උපකාර ඉල්ලා සිටිය හැකිය.



ඔබට තොරතුරු සහ සහාය ලබා දිය හැකි රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳව ද කාර්ය මණ්ඩලය ඔබට දැනුම් දෙනු ඇත.




ඔබට ඕනෑම වේලාවක එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය (UNHCR) සම්බන්ධ කරගත හැකිය. තම රට හැර යාමට සිදු වන පුද්ගලයින් UNHCR විසින් ආරක්ෂා කෙරේ.

## මගේ සටහන්

මෙම විස්තර පත්‍රිකාව තොරතුරු දැනගැනීමේ අරමුණු සඳහා පමණි. එමඟින් අයිතීන් හෝ වගකීම් නිර්මාණය නොකරයි. මෙම ලේඛනයේ ප්‍රධාන කොටස සපයා ඇත්තේ යුරෝපීය සංගමයේ රැකවරණය සඳහා වූ ආයතනය (EUAA) විසින් වන අතර, මෙම විස්තර පත්‍රිකාව පිටපත් කිරීම සහ වෙනස් කිරීම සඳහා EUAA විසින් අවසර දී ඇත්තේ EU සාමාජික රටවල් සඳහා පමණි. මෙම විස්තර පත්‍රිකාවේ ඇතුළත් තොරතුරුවල නිරවද්‍යතාවය, අන්තර්ගතය, පරිපූර්ණත්වය, නීත්‍යානුකූලභාවය හෝ විශ්වසනීයත්වය සඳහා EU සාමාජික රටවල හෝ වෙනත් වගකිවයුතු තෙවන පාර්ශවයක කිසිදු වගකීමක් හෝ වගවීමක් EUAA විසින් පිළි නොගැනේ. මෙම විස්තර පත්‍රිකාවේ අන්තර්ගත තොරතුරු මඟින් නිර්මාණය කළ හැකි යම් භාවිතයක් සඳහා EUAA හෝ EUAA වෙනුවෙන් ක්‍රියා කරන කිසිදු පුද්ගලයෙකු වගකිව යුතු නොවේ.

© European Union Agency for Asylum, 2025